සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

PMoE Sabaragamuwa

මගේ අංකය / எனது இல / My Number: ME/E/11/08/2-1වෙළම
ඔබේ අංකය / உமது இல / Your Number:
දිනය / திகதி / Date: 2023/05/19

අමාත්‍යාංශ ලේකම් / Secretary: Office – 045 2223015
කාර්යාලය / Office: නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

---

සබරගමුව,පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,රත්නපුර/බලන්ගොඩ,

ඇඹිලිපිටිය/නිවිතිගල/කෑගල්ල/මාවනැල්ල/දෙහිඕවිට,

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා සියළුම විදුහල්පතිවරුන්,

**සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන විදුහල් හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් සියළුම ආයතන වල අනධ්‍යයන කාර්ය මණ්ඩල වල වාර්ෂික ස්ථාන මාරු-2021(2022)**

උක්ත කාරණය සම්බන්ධයෙන් වූ මගේ සමාංක හා 2023.04.27 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කළ 2021(2022) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා ලබාදුන් අභියාචනා තීරණ හා 2023.05.03 දිනෙන් පසුව ලද අභියාචනා තීරණ හා බැඳේ.

02. වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ එක් එක් සේවක මහත්ම මහත්මීන් හට වෙන් වෙන් වශයෙන් ස්ථාන මාරුවීම් ලිපි මෙම අමාත්‍යාංශය මගින් නිකුත් කරනු නොලැබේ.

03. මෙම අභියාචනා තීරණ 2023.05.22 දින සිට ක්‍රියාත්මක වේ. අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නව සේවා ස්ථානයෙහි රාජකාරී භාර ගැනීමට හැකිවන සේ ස්ථාන මාරුවීම් ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයින් මුදා හැරීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය.

04. නව සේවා ස්ථානයෙහි රාජකාරි භාර ගැනීමට හැකිවන සේ ආයතන ප්‍රධානීන්එම නිලධාරීන් මුදා හැරීමට කටයුතු නොකරන අවස්ථාවේ දී ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව අවධාරණය කරමි.

05. නව සේවා ස්ථාන වල සේවයට වාර්තා නොකරන සියළුම සේවක මහත්ම මහත්මීන්ගේ නම් පැරණි සේවා ස්ථානවල වැටුප් ලේඛන වලින් ඉවත් කිරීමටත් 2023.ජුනි මස සිට ඔවුන්ට වැටුප් ගෙවීම නතර කිරීමටත් වහාම පියවර ගන්නා ලෙස මෙයින් දැනුම් දෙමි.

06. එක් එක් කලාපයන්ට අදාල 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබී ඇති අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු මේ සමඟ අමුණා එවන අතර එම ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීම පිළිබඳ ප්‍රගතිය 2023.06.15 දිනට මා වෙත වාර්තා කරන ලෙස ද කාරුණිකව දන්වා සිටිමි

සුජානි ආර්.විජේතුංග

ලේකම්

අධ්‍යාපන තොරතරු තාක්ෂණ හා

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය රත්නපුර